සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2023-02-26
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්,* ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ඇන්ජලා,** ශ්‍රී ලාංකික පුරවැසියෙකි. 2021 ජුනි 01 දින සිට වසර 2 ක කාලයක් සඳහා ඇය ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරිනියක වශයෙන් පත්කර තිබේ. ඇයට ටෝකියෝ නගරයේ මහල් නිවාසයක් ලබාදී තිබෙන අතර, ඇගේ වැටුප, අමතර දීමනාවක්ද සමඟ ශ්‍රී ලංකාවේ ඇගේ බැංකු ගිණුමට නොකඩවා ගෙවනු ලැබේ. **ඇන්ජලාගේ** ස්වාමි පුරුෂයා වන **තිළිණ** ද ඇය සමඟ ජපානයට ගොස් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, 2021/22 තක්සේරු වර්ෂයේ ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා **ඇන්ජලාගේ** වාසිකභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සුරේෂ්,** 2018 ඔක්තෝම්බර් 21 දින මහනුවර පිහිටි හිස් ඉඩමක් රු.10,000,000/- කට මිලදී ගත්තේය. ඔහු ඒ වෙනුවෙන් මුද්දර ගාස්තු වශයෙන් රු.399,000/- ක් ද, නීතිඥ ගාස්තු වශයෙන් රු.100,000/- ක් ද වැය කළේය. මිලදී ගැනීමෙන් පසු ඔහු රු.500,000/- ක් වැය කරමින් ඉඩම වටා තාප්පයක් ඉදි කළේය. ඔහු 2021 දෙසැම්බර් 15 දින එම ඉඩම රු.15,000,000/- කට ඔහුගේ ඥාති සහෝදරයාට විකුණන ලද අතර, එදිනට එම ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු.18,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉඩම විකිණීම මත **සුරේෂ්** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ මත බද්ද (Capital Gain Tax) **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) **සුරේෂ්** විසින් ප්‍රාග්ධන ලාභ මත බදු වාර්තාව ඉදිරිපත් කළ යුතු නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 01)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**අනුර, සීමාසහිත කරුණාරත්න සමාගමේ** සහකාර ගණකාධිකාරීවරයා වන අතර, 2021/22 තක්සේරු වර්ෂය තුළදී ඔහු වකුගඩු බද්ධ කිරීමක් සඳහා රෝහල් ගතවිය. **අනුර,** සමාගමට දක්වා ඇති හිතෛශීභාවය සැලකිල්ලට ගනිමින් **සීමාසහිත කරුණාරත්න සමාගම** විසින් ඔහුගේ වෛද්‍ය බිල්පත ප්‍රතිපූරණය කරන ලදි. තවද, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය, සමාගමේ සියලු සේවකයින් සඳහා සමානව අදාළ නොවේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ක්‍රිබ්ස්ට එදිරිව දේශීය ආදායම් කොමසාරිස් (Cribs Vs CIT) නඩු තීන්දුව සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් පදනම් කර ගනිමින් **සීමාසහිත කරුණාරත්න සමාගමෙන්** ලැබුණු වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය **අනුරගේ** බදු අයකළ හැකි ආදායමේ කොටසක් වන්නේදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

(A) **සීමාසහිත රිවස්ටන් ලෙෂර් (පෞද්ගලික) සමාගම,** සංචාරක හෝටලයක් පවත්වාගෙන යාම සඳහා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වී සිටියි. පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා උපුටාගෙන තිබේ:

| **ආදායම් වර්ගය** | **රු.** |
|---|---|
| කාමර ආදායම | 11,250,000 |
| බීමහලේ විකුණුම් | 3,300,000 |
| සේවා ගාස්තු මත ආදායම | 2,250,000 |
| **මුළු ආදායම** | **16,800,000** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සංචාරක සංවර්ධන බද්ද [Tourism Development Levy (TDL)] **තක්සේරු කරන්න**. (ලකුණු 03)

(B) **සරත්** ට, **සීමාසහිත ABC පොදු සමාගමේ** (කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි) කොටස් 10,000 ක් හිමිය. ඔහු 2022 ජනවාරි 12 දින ඔහුගේ තැරව්කරු වන **සීමාසහිත ඒජියා ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්ගලික) සමාගම** හරහා කොටස් 5,000 ක් විකුණන ලද අතර, කොටසක මිල රු.140/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සරත්** විසින් ගෙවිය යුතු කොටස් ගනුදෙනු බද්ද (Share Transaction Levy) **ගණනය කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි පුද්ගලයෙකු වන **සීමාසහිත රුෂී ඇඩ්ස් (පෞද්ගලික) සමාගම,** ප්‍රචාරණ හා උත්සව සංවිධාන සේවා සැපයීමේ නිරතව සිටියි. පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ ගිණුම් පොත්වලින් උපුටාගෙන තිබේ:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී උපයන ලද ආදායම් විස්තර පහත දැක්වේ (එකතු කළ අගය මත බදු රහිතව):

| | |
|---|---|
| ශ්‍රී ලංකාවෙන් පිටතදී ප්‍රයෝජනයට ගැනීම සඳහා සපයන ලද සේවාවන් වෙනුවෙන් විදේශීය සේවාදායකයින්ගෙන් ලද ආදායම් *[(ආදායම, විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවේ බැංකු ගිණුමක් හරහා ලැබුණු අතර, ඇමරිකානු ඩොලර් (USD )1 = රු.200/-) ]* | ඇමරිකානු ඩොලර් 150,000 |
| දේශීය සේවාදායකයින්ට සපයන ලද සේවා - SVAT | රු.22,671,600 |
| දේශීය සේවාදායකයින්ට සපයන ලද සේවා - SVAT නොවන | රු.44,868,400 |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| කාර්යාල වියදම් මත | 950,000 |
| ප්‍රචාරණ ද්‍රව්‍ය මිලදී ගැනුම් මත | 1,264,000 |
| ප්‍රධාන විධායක නිලධාරී විසින් පාවිච්චි කරන ලද මෝටර් රථයේ රක්ෂණ වාරිකය මත | 12,500 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද (input VAT) රු.486,000/- කි.

(4) කාලපරිච්ඡේදයට අදාළ සියලු සරල එකතු කරන ලද අගය මත බදු [Simplified VAT (SVAT)] බැර වවුචර පත් එකතු කරගෙන තිබේ.

(5) සමාගම, මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.500,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 8% ක් ලෙස සලකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝසි ටෙක්ස්ටයිල් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, එය රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යයි. 2021/22 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම ලෙස රු.3,500,000/- ක් දක්වමින් සමාගම ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් ප්‍රකාශය [Estimated Tax payable (SET)] ඉදිරිපත් කර තිබේ. පළමු හා දෙවන කාර්තුවල වාරික වශයෙන් රු.1,800,000/- ක් ගෙවා තිබේ. සමාගම, මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා නිසා ඉන්පසු ගෙවීම් කර නොමැත.

තුන්වන වාරික ගෙවීම සඳහා සිහි කැඳවීමක් සහකාර කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති අතර, ඉදිරියේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම සඳහා බලයලත් නියෝජිතයා ලෙස ඔබව පත් කිරීමට සමාගම බලාපොරොත්තු වෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2021/22 තක්සේරු වර්ෂය සඳහා තුන්වන වාරික ගෙවීම වශයෙන් ගෙවිය යුතු මුදල **ගණනය කරන්න**.(ලකුණු 02)

(b) 2021/22 තක්සේරු වර්ෂයේ ආදායම් බදු වාරික ගෙවීම සඳහා නියමිත දිනයන් **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) ප්‍රමාද ගෙවීම් මත දණ්ඩන වළක්වා ගැනීම සඳහා සමාගමට ගත හැකි පියවරක් **සඳහන් කරන්න**. (ලකුණු 02)

(d) පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් යොදාගන්නා ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

කොළඹ පවත්වාගෙන යන රූපාලාවන්‍යාගාරයක් වන **ලා පැෂන්, නෙළුම් සහ මානෙල්** යන සහෝදරියන් දෙපළ විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුහු පිළිවෙලින් 1:1 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගැනීමට එකඟ වී සිටිති.

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | **රු.** |
|---|---:|
| දළ ලාභය | 9,250,000 |
| වෙනත් ආදායම් | 550,000 |
| | **9,800,000** |
| අඩු කළා: පරිපාලන හා වෙනත් වියදම් | (4,125,000) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **5,675,000** |

ඉහත ලාභය ගණනය කිරීමේදී පහත දැක්වෙන වියදම් අඩුකරගෙන තිබේ:

(1) හවුල්කාරියන් දෙදෙනාම මාසික වැටුප වශයෙන් රු.150,000/- බැගින් ලබාගෙන තිබේ.

(2) **නෙළුම්** විසින් රු.800,000/- ක කාරක ප්‍රාග්ධනයක් හවුල් ව්‍යාපාරයට ලබා දී තිබෙන අතර, පොලිය වශයෙන් රු.120,000/- ක් ගෙවා තිබේ.

(3) **මානෙල්ගේ** දියණිය සහායිකාවක වශයෙන් සති අන්තයේදී සේවය කරන අතර, වර්ෂය තුළදී රු.260,000/- ක දීමනාවක් ඇයට ගෙවා තිබේ.

(4) වැඩිහිටි පුද්ගලයින් සඳහා ආයතනික රැකවරණය සැලසීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට රු.100,000/- ක මුදල් පරිත්‍යාගයක් සිදුකර තිබේ.

(5) ඉතිරිකිරීමේ ගිණුම මත පොලිය ලෙස බැංකුවෙන් ලැබුණු රු.200,000/- ක් වෙනත් ආදායම්හි ඇතුළත් වන අතර, ඉතිරිය සුවඳ විලවුන් විකිණීමෙන් ලද ආදායම වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන අතර, අපනයන වෙළෙඳපොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනයේ නිරතව සිටියි.

පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන තිබේ:

(1) සියලු වියදම් අයකිරීමෙන් පසු හා සියලු ආදායම් බැර කිරීමෙන් පසු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බද්දට පෙර ශුද්ධ ලාභය රු.21,450,000/- ක් විය. සමාගමේ මුළු පිරිවැටුම රු.430,500,000/- ක් විය.

(2) වෙනත් ආදායම් විස්තර:

| | රු. |
|---|---:|
| ලැයිස්තුගත කොටස් විකිණීමෙන් ලද ලාභය | 1,230,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 2,395,000 |
| ලාභාංශ ආදායම - ලැබුණු ලාභාංශවලින් | 3,840,000 |
| පරිගණක මේස විකිණීමෙන් ලද ලාභය | 25,000 |

(3) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම් (පිරිවැය) | 2021.04.01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් / අත්පත් කර ගැනීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2022.03.31 දිනට ශේෂය (රු.) |
|---|---:|---:|---:|---:|
| ඉඩම | 2,420,000 | - | - | 2,420,000 |
| කාර්යාල ගොඩනැගිල්ල | 8,250,000 | - | - | 8,250,000 |
| මෝටර් වාහන | 14,870,000 | 5,500,000 | - | 20,370,000 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 3,270,000 | - | 900,000 | 2,370,000 |
| **එකතුව** | **28,810,000** | **5,500,000** | **900,000** | **33,410,000** |

- සේවකයින් ප්‍රවාහනය සඳහා වර්ෂය තුළදී මිලටගත් ආසන 20 මිනි බස් රථය හැර, සියලුම මෝටර් වාහන, බෙදාහැරීමේ වෑන් රථ හා ලොරි රථවලින් සමන්විත වේ.
- 2018/19 තක්සේරු වර්ෂයේදී මිලට ගත් පරිගණක මේස කිපයක් රු.600,000/- කට විකුණන ලදී.
- ඉහත විශේෂයෙන් සඳහන් කරන ලද ඒවා හැර, 2021 අප්‍රේල් 01 දිනට පැවති අනෙකුත් සියලු වත්කම් 2019/20 තක්සේරු වර්ෂයේදී අත්පත් කරගත් ඒවා වන අතර, අත්පත් කරගත් දින සිට ප්‍රාග්ධන දීමනා ලබාගෙන තිබේ.

(4) පරිපාලන වියදම් හි පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.4,150,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.2,190,000/- කි.
- වර්ෂය තුළදී කාර්යාල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා සහ නඩත්තු සඳහා රු.300,000/- ක් දරා තිබේ.

(5) බෙදාහැරීමේ වියදම් හි පහත දෑ ඇතුළත් වේ:

- තක්සේරු වර්ෂය තුළදී සමාජ මාධ්‍යයන්හි සිදුකළ ප්‍රචාරණ ව්‍යාපාර සඳහා රු.1,900,000/- ක් දරණ ලදී.
- පාරිභෝගිකයින්ට සංග්‍රහ කටයුතු සඳහා සමාගම රු.1,425,000/- ක් දරා තිබේ.
- සමාගම, රු.2,400,000/- ක් වටිනා අධ්‍යාපනික උපකරණ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට පරිත්‍යාග කර තිබේ.
- නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන ලද පර්යේෂණයක් සඳහා සමාගම රු.1,500,000/- ක් දරා තිබේ.

(6) 2021/22 තක්සේරු වර්ෂය සඳහා ස්ව-තක්සේරු පදනම මත ගෙවන ලද බද්ද රු.1,500,000/- කි.

(7) ව්‍යාපාරයේ අනෙකුත් සියලු වියදම්, ආදායම් බදු කටයුතු සඳහා ඉඩදෙනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)*** (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රංජනී** වරලත් ගණකාධිකාරිවරියක් වන අතර, ඇය ශ්‍රී ලංකාවේ සමාගමක ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස සේවය කරයි.

2021/22 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **රංජනීගේ** ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසයකට රු.350,000/- බැගින්.
- එක් මාසයක වැටුපට සමාන ප්‍රසාද දීමනාවක් 2021 අප්‍රේල් මාසයේදී ගෙවා තිබේ.
- සමාගම මෝටර් රථයක් (1000 cc) ඉන්ධන සමඟ ඇයට ලබා දී තිබේ.
- ඇය රු.40,000/- ක මාසික කුලියක් ගෙවමින් කොට්ටාවේ පිහිටි කුලී නිවසක වාසය කරයි. සමාගම, මාසයකට රු.30,000/- ක් ප්‍රතිපූරණය කරයි.
- වර්ෂය තුළදී සමාගම විසින් සමූහයේ ප්‍රාදේශීය සමුළුව සඳහා සමාගම නියෝජනය කරමින් ඇයව දකුණු කොරියාවට යැවීය. සංචාරයේ පිරිවැය වූ රු.350,000/- සමාගම විසින් ප්‍රතිපූරණය කරන ලදී.
- **රංජනී,** අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] අඩුකිරීම සඳහා ඇගේ කැමැත්ත ප්‍රකාශ කර තිබේ. වර්ෂය සඳහා අඩුකරන ලද බද්ද රු.143,400/- ක් විය.

(2) ඇය ගිණුම් ආයතනයක් පවත්වාගෙන යන අතර, වර්ෂය සඳහා ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | රු. | රු. |
|---|---|---|
| සේවාදායකයන්ගෙන් ලද ආදායම | | 5,870,000 |
| **අඩු කළා:** ගෙවීම් | | |
| සහායක සඳහා වැටුප් | 900,000 | |
| ලිපි ද්‍රව්‍ය | 465,000 | |
| පරිගණකය මත ක්ෂය (වර්ෂය තුළදී රු.240,000/- කට මිලට ගන්නා ලදී) | 60,000 | (1,425,000) |
| **ශුද්ධ ලාභය** | | **4,445,000** |

(3) ඇගේම නිවස මතුගම පිහිටා තිබෙන අතර, එය රු.30,000/- ක මාසික කුලියකට, කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.150,000/- ක් වන අතර, 25% ක අනුපාතයක් යටතේ කුලී නිවැසියා විසින් වරිපනම් ගෙවා තිබේ.

(4) වර්ෂය තුළදී, **රංජනීට** පහත සඳහන් පොලී ආදායම් ලැබී තිබේ:

- රුපියල් ස්ථාවර තැන්පතු මත රු.245,300/-.
- වාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම [Resident Foreign Currency Account (RFC)] මත රු.1,200,000/-.

(5) **රංජනී,** වර්ෂය තුළදී පහත සඳහන් ගෙවීම් සිදුකර තිබේ:

- වෛද්‍ය රක්ෂණයක් සඳහා දායකත්වය රු.300,000/- කි.
- මාස 6 ක බදුකරණ පාඨමාලාවක් හැදෑරීම සඳහා දේශීය ආයතනයකට ගෙවූ ගාස්තුව රු.50,000/- කි.

(6) වර්ෂය තුළදී, ඇය රු.500,000/- ක් වටිනා පොත්, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කර තිබේ. එසේම, ආබාධිත පුද්ගලයින් සඳහා නිවාසයක් පවත්වාගෙන යන පුණ්‍යායතනයකට රු.100,000/- ක් වටිනා භාණ්ඩ පරිත්‍යාග කර තිබේ.

(7) **රංජනී,** 2021/22 තක්සේරු වර්ෂය සඳහා වාරික ගෙවීම් වශයෙන් රු.300,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා **රංජනීගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |